රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:- 313

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1985 නොවැම්බර් මස 22 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

**1984 අගෝස්තු 01 දින සිට 1984 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ ඇතිවූ කලබල නිසා දේපලවලට හානි සිදුවූ සහ/හෝ චංචල දේපල අහිමි වූ රජයේ නිලධරයන්ට හා රාජ්‍ය සංස්ථා සේවකයන්ට වැටුප් අත්තිකාරම්.**

1984 අගෝස්තු මස 1 දින සිට 1984 දෙසැම්බර් 31 දින දක්වා (දෙදිනම ඇතුලුව) කාලය ඇතුළත අනුරාධපුර, කෑගල්ල, කුරුණෑගල, කොළඹ, ගම්පහ, ගාල්ල, ත්‍රිකුණාමලය, නුවරඑළිය, පුත්තලම, බදුල්ල, මහනුවර, මාතලේ සහ රත්නපුර දිස්ත්‍රික්කවල ඇතිවූ කලබල හේතු කොට ගෙන, ස්වකීය නිවෙස්වල දේපල වලට හානි සිදුවූ සහ/හෝ චංචල දේපල අහිමි වූ රජයේ නිලධරයකු (කලත්‍රයන් දෙදෙනාම රජයේ නිලධරයන් වන විට ඒ එක් එක් අයට වෙන වෙනම ද) සඳහා,

(1) වැටුප් අත්තිකාරම අනුමත කරන දිනට වර්ෂ 10 ක (දහයක) අවම සේවයක් සහිත, සේවයේ ස්ථිර කරන ලද රජයේ නිලධරයකුට උපරිම වශයෙන් වර්ෂ දෙකක (දීමනා හැර) නව ඒකාබද්ධ වැටුප දක්වා අත්තිකාරමක්, හෝ

(11) වර්ෂ 10 කට (දහයකට) අඩු සේවා කාලයක් සහිත සේවයේ ස්ථිර කරන ලද රජයේ නිලධරයකුට උපරිම වශයෙන් වර්ෂයක (දීමනා හැර) නව ඒකාබද්ධ වැටුප දක්වා අත්තිකාරමක්;

පහත සඳහන් කොන්දේසි වලට යටත්ව ගෙවිය හැක.

(අ) දෙන ණය ප්‍රමාණය දෙපාර්තමේන්තු ප්‍රධානියා සෑහීමකට පත්වන පරිදි ඔප්පු කරන ලද හානියේ ප්‍රමාණයට අනුකූල විය යුතුය.

(ආ) ආපසු ගෙවීමේ කාලය වර්ෂ 8 ක් (අටක්) නොඉක්මවිය යුතුය.

(ඇ) අයකළ යුතු පොලිය සියයට 7.2 ක් (හතයි දශම දෙකක්) විය යුතුය.

(ඈ) ස්ථිර කරන ලද රජයේ නිලධරයන් දෙදෙනෙකු පුද්ගලික වශයෙන් ඇප විය යුතුය. (යෝජිත ඇපකරුවන් දෙදෙනාම ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුව සුදුසු වූද, යෝග්‍ය වූද, පුද්ගලයන් බවට ණය අනුමත කරන බලධාරියා සෑහීමකට පත්විය යුතුවේ.)

(ඉ) අත්තිකාරම් ලාභියා වයස අවුරුදු 55 වන විට ණය ප්‍රමාණය හා පොලිය සම්පූර්ණයෙන් අයකර ගත හැකි වන පරිදි අත්තිකාරම් මුදල හෝ වාරිකය හෝ තීරණය කළ යුතුය.

(ඊ) විශ්‍රාම ගැනීමට පෙර ණය මුදල ගෙවා අවසන් කරන බවට හෝ විශ්‍රාම යන්නා අවස්ථාවේදී තම විශ්‍රාම වැටුප පරිවර්තනය කර, ආපසු ගෙවීමට ඇති ණය

ශේෂයක් වෙතොත්, එම ශේෂය තමාගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්‍ෂ ට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය දෙන බවට හෝ, අවලංගු කළ නොහැකි පොරොන්දුවක් මත, වයස 55 ආසන්න නිලධාරියෙකුට ද වැටුප් අත්තිකාරම ගෙවිය හැකිය. ආයතන සංග්‍රහයේ 14 වන පරිශිෂ්ඨයේ දැක්වෙන ආකෘති පත්‍රය අවලංගු කළ නොහැකි පොරොන්දුව සඳහා යොදා ගත යුතුවේ.

වැටුප් අත්තිකාරම ආපසු ගෙවීම වර්ෂ 8 කට නොවැඩි කාලයක් ඇතුළත තරප්පේය යන පදනම මත වාරිකය ගණනය කිරීම ගැන විරුද්ධත්වයක් නැත.

සහ (උ) වයස අවුරුදු 55 එළඹීමට පෙර ණය කරු මිය ගිය හොත්/කිනම් හේතුවක් නිසා හෝ සේවයෙන් විශ්‍රාම ගිය හොත්, එම සිද්ධිය සිදුවන අවස්ථාවේදී ණය මුදල හා පොලියෙන් නොගෙවා ඉතිරිව තිබෙන ප්‍රමාණය ණයකරුගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිකයෙන් හෝ ප්‍රථමයෙන් අයකර ගත යුතු මුදලක් හැටියට සැලකිය යුතුය.

2. (අ) මෙම අත්තිකාරම් මුදල රජයේ නිලධරයෙකුට හෝ ඔහුගේ කලත්‍රයාට හෝ කලින් දී ඇති ණය මුදලක් වේ නම් ඒවාට අතිරේකවූත් වෙනස්වූත් එකක් වේ. සහ,

(ආ) අත්තිකාරම් ලාභියා සහ ඇපකරුවන් මු.රෙ.238 සහ ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 3 වගන්තියෙහි දැක්වෙන 40% හෝ 33 1/3% අඩුකිරීම් සීමාවෙන් නිදහස්ය.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 237 හා 250 යටතේ කලින් වැටුප් අත්තිකාරමක් ලබාගෙන ඇති නිලධාරියෙකුට ද, ඉහත කාලය තුළදී එවැනි දේපල හානියකට භාජනය වූයේ නම්, මෙම චක්‍රලේඛය යටතේ ලබාගත හැකි අත්තිකාරම හා කලින් ලබාගත් අත්තිකාරමෙන් නොගෙවා ඉතිරිව ඇති ප්‍රමාණය අතර වෙනස ගෙවිය හැකිය.

3. මෙම අත්තිකාරම සඳහා නියමිත ආකෘති පත්‍රයේ සකස් කළ අයදුම්පත් 1986.01.31 දින හෝ ඊට ප්‍රථම දෙපාර්තමේන්තු ප්‍රධානියාට ලැබෙන සේ එවිය යුතුය. 1984.01.19 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 237 ට අමුණා තිබූ ආදර්ශ අයදුම්පත්‍රය මේ සඳහා යොදා ගත යුතුය.

4. ගිවිසුම සහ ඇප බැඳුම්කරයට පිළිවෙලින් රු.1 සහ රු.10 ක වටිනාකම සහිත මුද්දර ඇලවිය යුතුය.

5. අංක 237 හා 1984.01.19 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4 ඡේදයේ සිට 12 දක්වා විධිවිධාන මෙම අත්තිකාරම සඳහා ද අදාළ වේ.

Siriwardhana

ලේකම්,

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.